# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 9 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

පුරවැසි අධ්‍යාපනය

9 ශ්‍රේණිය

විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය 2017

c ජාතික අධ්‍යාපන ආයතනය

ISBN.....................

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | i |
| ජාතික පොදු අරමුණු | ii |
| මූලික නිපුණතා | iii - iv |
| පුරවැසි අධ්‍යාපනය 6 - 11 ශ්‍රේණි විෂය අරමුණු | v |
| ජාතික පොදු අරමුණු හා විෂය අරමුණු අතර සම්බන්ධතාව දක්වන වගුව | vi |
| විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | vii |
| විෂය නිර්දේශය | 1 - 25 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා | 26 |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | 27-28 |
| ඇගයීම හා තක්සේරුකරණය | 28 |
| විෂය නිර්දේශය සම්පාදක මණ්ඩලය | 29 |

# හැඳින්වීම

පුරවැසි අධ්‍යාපනය විෂය පාසල් පද්ධතියට හඳුන්වා දීමේ ප්‍රධානතම පරමාර්ථය වන්නේ **ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම යි.** සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි විවිධ ජන වර්ග ලෙස හෝ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික/ ක්‍රිස්තියානි ආදි වශයෙන් ආගමික කොටස් ලෙස හෝ බෙදී වෙන් වී සිටිනවාට වඩා සියලු ජන වර්ග, ආගමික කොටස් කිසිදු භේදයකින් තොර ව ශ්‍රී ලංකා මාතාවගේ එක ම දූ පුතුන් ලෙස සමඟියෙන්, සහජීවනයෙන්, සමානාත්මතාවෙන්, සාමකාමී ව ජීවත් වනු දැකීම ''සාමය'' අගයන සැමගේ ද ප්‍රාර්ථනාව යි. තිරසර සාමය ළඟා කර ගැනීම සඳහා "ස්වකීය පවුලේ සිට විශ්ව ව්‍යාප්ත පවුල තෙක්" යන තේමාව යටතේ ප්‍රධාන විෂය අරමුණු 12ක් හා ප්‍රධාන විෂය නිපුණතා 20ක් යටතේ පුරවැසි අධ්‍යාපනය විෂය 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය තෙක් ක්‍රියාත්මක වේ.

6 - 9 ශ්‍රේණි සඳහා අනිවාර්ය විෂයයක් ලෙසත්, 10 - 11 ශ්‍රේණි සඳහා පළමු වන කාණ්ඩයේ විෂයයක් ලෙසත් ක්‍රියාත්මක වන පුරවැසි අධ්‍යාපනය විෂයයට අදාළ 9 ශ්‍රේණියේ විෂය නිර්දේශය මේ සමඟ ඉදිරිපත් කෙරේ.

සමාජ සුරක්ෂිතතාව, කාලීන වෙනස් වීම්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, පළාත් පාලන ආයතන, ගැටුම් නිරාකරණය හා වැඩ ලෝකය යන ප්‍රධාන මාතෘකා 06ක් ඔස්සේ ජාතියේ දූපුතුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙම ශ්‍රේණියේ දී අපේක්ෂා කෙරේ.
6 වන ශ්‍රේණියේ සිට විවිධ මාතෘකා ඔස්සේ පුරවැසි දැනුම, පුරවැසි ආකල්ප, පුරවැසි කුසලතා සංවර්ධනය කර ගනිමින් පුරවැසි ක්‍රියාකාරකම්වල යෙදෙන දූපුතුන් තව දුරටත් ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවට මෙන් ම ලෝක සමාජයට ගැළපෙන යහපත් පුරවැසියන් නිර්මාණය කිරීමේ දී 9 ශ්‍රේණියට අදාළ නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය මෙන් ම ඉගෙනුම් පල ද ඉතා වැදගත් බව අවධාරණය කරමු.

සමඟිය, සහජීවනය, සංහිඳියාව මඟින් ශ්‍රී ලංකා මාතාවට තිරසර සාමයක් ළඟා කර ගැනීමට යන ගමනේ දී පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් ඉටු කළ හැකි සමාජ මෙහෙවර අතිවිශාල බව ද මෙහි දී සිහිපත් කරමු. ඒ කෙරෙහි ඔබගේ අවධානය යොමු වනු ඇතැයි ද, පූර්ණ සහයෝගය හා දායකත්වය ලැබෙනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව, ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගාගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමඟ එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංගවලින් හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැඟීම

07. ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථික න්‍යාය හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැඟීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කරගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගාගැනීම මඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

## ජාතික පොදු අරමුණු සහ විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව දක්වන වගුව

| විෂය නිර්දේශයේ අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගාගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | √ | | | | | | |
| 02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම | | | | | √ | | | |
| 03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමග එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | | | | | | | √ |
| 04. නිරතුරු ව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම | | | | | | | √ | |
| 05. බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංගවලින් හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම | √ | | | | | | | |
| 06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීම | | | √ | | | | | |
| 07. ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම | | | | | | | √ | |
| 08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම | | | | | | | | √ |
| 09. විවිධ ආර්ථික න්‍යාය විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම | | | | | | √ | | |
| 10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැගීම | | | | | √ | | | |
| 11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කරගැනීම | √ | | | | | | | |
| 12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගාගැනීම මඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම | | | | √ | | | | |

## පුරවැසි අධ්‍යාපනය 9 ශ්‍රේණිය විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| පාසල් වාරය | නිපුණතාව | නිපුණතා මට්ටම් | කාලච්ඡේද ගණන | නිපුණතා මට්ටම් ගණන |
|---|---|---|---|---|
| පළමු වන වාරය | 9.1 | 9.1.1, 9.1.2 | 08 | 02 |
| | 9.2 | 9.2.1, 9.2.2, 9.2.3,<br>9.2.4, 9.2.5, 9.2.6 | 12 | 06 |
| දෙවන වාරය | 9.3 | 9.3.1, 9.3.2, 9.3.3,<br>9.3.4, 9.3.5, 9.3.6 | 12 | 06 |
| | 9.4 | 9.4.1, 9.4.2, 9.4.3,<br>9.4.4, 9.4.5 | 08 | 05 |
| තෙවන වාරය | 9.5 | 9.5.1, 9.5.2, 9.5.3 | 06 | 03 |
| | 9.6 | 9.6.1, 9.6.2, 9.6.3,<br>9.6.4, 9.6.5, 9.6.6,<br>9.6.7, 9.6.8, 9.6.9,<br>9.6.10, 9.6.11, 9.6.12,<br>9.6.13 | 14 | 13 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **සමාජ සුරක්ෂිතතාව**<br>9.1<br>ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරී ව කටයුතු කරයි. | 9.1.1<br>සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන පිළිබඳ ව විමර්ශනය කරයි. | • සමාජ සුරක්ෂිතතාව<br>  • සමාජය හැඳින්වීම<br>  • සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාව<br>  • සමාජ සුරක්ෂිතතාව හැඳින්වීම<br>  • සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන හා ඒවායින් ඉටු වන කාර්යභාරය<br>    - පවුල<br>    - පාසල<br>    - ආගමික ආයතන<br>    - සමාජ ආයතන<br>  • මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය, අනෙකුත් විෂමාචාර ක්‍රියා ආදිය වැළැක්වීම සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ හා විවිධ ආයතනවල වගකීම් හා යුතුකම්<br>• සමාජ සුරක්ෂිතතාව සඳහා වන නීති<br>  • නීතිය හැඳින්වීම<br>  • නීතියේ ගුණාංග<br>  • නීති මූලාශ්‍රය<br>• නීති වර්ග<br>  • **දේශීය නීතිය** | • සමාජය යන්න හඳුන්වයි.<br>• සමාජ සුරක්ෂිතතාව පැහැදිලි කරයි.<br>• සමාජ සුරක්ෂිතතාව සඳහා දායක වන ආයතන හා ඒවායේ කාර්යභාරය වගුගත කරයි.<br>• මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය, අනෙකුත් විෂමාචාර ක්‍රියා ආදිය වැළැක්වීම සමාජ වගකීමක් වන බව පැහැදිලි කරයි.<br>• සමාජ සුරක්ෂිතතාව සඳහා වන නීති විස්තර කරයි.<br>• නීතිය බලාත්මක කිරීම සඳහා දායක වන විවිධ ආයතන පිළිබඳ විස්තර කරයි.<br>• සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් අධිකරණයෙන් සිදු වන සේවය පිළිබඳ අදහස් දක්වයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | ★ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය<br>★ අපරාධ නීතිය<br>★ සිවිල් නීතිය<br>• නීතිය බලාත්මක කිරීම සඳහා පවතින ආයතන<br>• අධිකරණය<br>★ ශ්‍රේෂ්ඨාධිකරණය<br>★ අභියාචනාධිකරණය<br>★ පළාත්බද මහාධිකරණ<br>★ මහාධිකරණය<br>★ දිසා අධිකරණය<br>★ මහේස්ත්‍රාත් අධිකරණය<br>• පොලීසිය<br>• නීතිපති දෙපාර්තමේන්තුව<br>• රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව<br>• බන්ධනාගාර දෙපාර්තමේන්තුව<br>• ආරක්ෂක හමුදා<br><br>• **අන්තර්ජාතික නීතිය** | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.1.2<br>සමාජ සුරක්ෂිතතාවට දායක වන විවිධ ආයතන සමඟ අභිමානවත් පුරවැසියකු ලෙස සහයෝගයෙන් කටයුතු කරයි. | • සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා යොදා ඇති යාන්ත්‍රණ, නීතිරීති හා බැඳුණු පුද්ගල වගකීම් හා යුතුකම්<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනෙකුත් නීතිරීති<br>• අධිකරණය<br>• පොලීසිය<br>• ආරක්ෂක හමුදා<br>• සමථ මණ්ඩල<br>• ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>• මානව හිමිකම් කොමිසම | • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනෙකුත් නීතිරීති අනුගමනය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ ක්‍රියාවලියට සහාය දැක්වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා පොලීසියට සහාය වීම සම්බන්ධයෙන් පුරවැසි කාර්යභාරය විස්තර කරයි.<br>• ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටයුතු කරන ත්‍රිවිධ හමුදාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි<br>• සමාජ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සමථ මණ්ඩල ක්‍රියාවලියට දායක වීමේ වැදගත්කම විස්තර කරයි.<br>• සමාජ සුරක්ෂිතතාවට දායක වන වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| කාලීන වෙනස් වීම්<br>9.2<br>සමාජ යහපතට දායක වන තාක්ෂණික, ආර්ථික හා සමාජ වෙනස් වීම්වලට අනුගත ව ක්‍රියා කරයි. | 9.2.1<br>කාලීන වෙනස් වීම් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන ආකාරය විමර්ශනය කරයි. | • තාක්ෂණික වෙනස් වීම් හා ඒවාට දක්වන ප්‍රතිචාරවල වැදගත්කම<br>• තාක්ෂණය හැඳින්වීම<br>• තාක්ෂණික වෙනස් වීම් හැඳින්වීම<br>• විවිධ ගවේෂණ, පර්යේෂණ මඟින් කරනු ලබන සොයා ගැනීම්<br>• තාක්ෂණික වෙනස් වීම් සමඟ ඇති වන සමාජ වෙනස් වීම්<br>• නිර්මාණශීලී පුරවැසියකු වශයෙන් තාක්ෂණික වෙනස් වීම් යොදා ගැනීමේ වැදගත්කම<br>• යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමේ වැදගත්කම | • තාක්ෂණික වෙනස් වීම් පැහැදිලි කරයි.<br>• ගවේෂණ හා පර්යේෂණ නව සොයා ගැනීම්වලට දායක වන බව පැහැදිලි කරයි.<br>• තාක්ෂණික වෙනස් වීම් සමාජ වෙනස්වීම්වලට බලපාන ආකාරය විස්තර කරයි.<br>• යෝග්‍ය තාක්ෂණය භාවිතයෙන් භෞතික හා මානව සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ආකාර පෙන්වා දෙයි.<br>• තිරසර සංවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණය භාවිතයේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 |
| | 9.2.2<br>ආර්ථිකයේ සිදු වන වෙනස් වීම්වලට අනුගත ව ක්‍රියා කරයි. | • ආර්ථිකයේ සිදු වන වෙනස් වීම්<br>• කෘෂි අංශය<br>• කාර්මික අංශය<br>• සේවා අංශය<br>• ආර්ථිකයේ සිදු වන විවිධ වෙනස් වීම්වල පුද්ගල හා සමාජ බලපෑම<br>• ආර්ථිකයේ සිදු වන කාලීන වෙනස් වීම් උචිත පරිදි භාවිතයට ගැනීම | • ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවල සිදු වන කාලීන වෙනස් වීම් පැහැදිලි කරයි.<br>• ආර්ථිකයේ සිදු වන විවිධ වෙනස් වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑම් විශ්ලේෂණය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • ආර්ථිකයේ සිදු වන කාලීන වෙනස් වීම්වලට උචිත පරිදි අනුගත වීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | |
| | 9.2.3<br>රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා විමර්ශනය කරයි. | • රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා හඳුනා ගැනීම<br>• නව ප්‍රවණතා ඔස්සේ විවෘත වන රැකියා | • රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා විස්තර කරයි.<br>• නව රැකියා සඳහා සපුරා ගත යුතු සුදුසුකම් පිළිබඳ ව සාකච්ඡා කරයි. | 02 |
| | 9.2.4<br>තරගකාරී ලොව තුළ යහජීවන ගුණාංග ප්‍රගුණ කරමින් සහජීවනයෙන් කටයුතු කරයි. | • යහජීවනය හැඳින්වීම<br>• යහජීවනයක අවශ්‍යතාව<br>  • සමාජයේ යහපැවැත්ම සඳහා<br>  • පුද්ගල අභිරුචීන් විවිධ වීම<br>  • ජීවන රටාව සංකීර්ණ වීම<br>  • ධාර්මික බව<br>  • සාධාරණත්වය<br>  • සාමය<br>• යහජීවන ගුණාංග<br>  • නීති ගරුක බව<br>  • ධාර්මික දිවි පැවැත්ම<br>  • සතුටින් සිටීම<br>  • ලද දෙයින් සතුටු වීම | • යහජීවනය යන්න හඳුන්වයි.<br>• තරගකාරී ලොව තුළ යහජීවනයක අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• යහජීවන ගුණාංග පැහැදිලි කරයි.<br>• මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය හා අනෙකුත් විෂමාචාර ක්‍රියා යහජීවනය බිඳ වැටීමට හේතු වන අයුරු විස්තර කරයි.<br>• යහජීවනයෙන් කටයුතු නොකිරීම නිසා අත්වන ප්‍රතිඵල පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • හෘද සාක්ෂ්‍යයට එකඟ ව කටයුතු කිරීම<br>• සැහැල්ලු දිවි පැවැත්ම<br>• ධෛර්යවන්ත භාවය<br>• මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය හා අනෙකුත් විෂමාචාර ක්‍රියා යහජීවනය බිඳ වැටීම සඳහා හේතු වන ආකාරය.<br><br>• සහජීවනය හැඳින්වීම<br>• සහජීවනයක අවශ්‍යතාව<br>• සහජීවන ගුණාංග<br>• සහයෝගයෙන් කටයුතු කිරීම<br>• අන්‍යයන්ට ගරු කිරීම<br>• බෙදාහදා ගැනීම<br>• අන්‍යෝන්‍ය විශ්වාසය<br>• සුහද බව<br>• අවංක බව<br>• සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමේ වැදගත්කම<br>• යහජීවනය හා සහජීවනය පුද්ගල හා සමාජ සංවර්ධනයට වැදගත් වන ආකාරය | • යහජීවනය සමාජයේ යහපැවැත්මට බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• යහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගත හැකි ආකාර යෝජනා කරයි.<br><br>• සහජීවනය යන්න හඳුන්වයි.<br>• සහජීවන ගුණාංග විස්තර කරයි.<br>• සමාජයේ යහපැවැත්ම සඳහා සහජීවනයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• යහජීවනය හා සහජීවනය පුද්ගල හා සමාජ සංවර්ධනයට වැදගත් වන ආකාරය සාකච්ඡා කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.2.5<br>සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියකු ලෙස කටයුතු කරයි. | • සමුපකාර ව්‍යාපාරය හැඳින්වීම<br>• සමුපකාර ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය<br>• විවිධ සේවා සමුපකාර සමිති හා පාසල් සමුපකාර සමිති | • සමුපකාර ව්‍යාපාරයේ අරමුණු හා කාර්යභාරය පැහැදිලි කරයි.<br>• විවිධ සේවා සමුපකාර සමිතවල හා පාසල් සමූපකාර සමිතිවල අවශ්‍යතාව සාකච්ඡා කරයි. | 02 |
| | 9.2.6<br>දේශීයත්වය රැක ගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ලෙස කටයුතු කරයි. | • ලෝකය පිළිබඳ පුළුල් දැක්ම<br>• දේශීයත්වය අර්ථාන්විත ව අගය කිරීම<br>★ දේශීය සංස්කෘතිය<br>★ දේශීය නිෂ්පාදන<br>★ දේශයට ආවේණික දේ උදාහරණ:- ඖෂධ, ශාක, සතුන් වැනි<br>• දේශීය රාමුවෙන් ඔබ්බට ගොස් අන්‍ය සංස්කෘති හඳුනා ගැනීම හා ඒවායින් ඉගෙනීම<br>• සහජීවනය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම<br>• අන්‍යෝන්‍ය රැඳියාව<br>★ කිසි ම පුද්ගලයකුට, ජන වර්ගයකට, රටකට, ලෝකයේ තනි ව පැවතිය නොහැකි බව | • දේශීයත්වය අර්ථාන්විත ව විස්තර කරයි.<br>• දේශීයත්වය රැකගැනීමට දායක වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• දේශීයත්වය රැකගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම සාකච්ඡා කරයි.<br>• අන්‍යෝන්‍ය රැඳියාව මඟින් ගෝලීය වශයෙන් සහජීවනය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**<br>9.3<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි. | 9.3.1<br>ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි. | • ''ප්‍රජාතන්ත්‍රවාදය'' හැඳින්වීම<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය අංග<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්නා රටවලට නිදසුන් | • ''ප්‍රජාතන්ත්‍රවාදය''යන සංකල්පය සරල ව පැහැදිලි කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ සාකච්ඡා කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය අංග විස්තර කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පවතින රටවලට නිදසුන් දක්වයි. | 02 |
| | 9.3.2<br>ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් විමර්ශනය කරයි. | • ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම්<br>• අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී සමාජයට ඉටු කළ යුතු යුතුකම්<br>• නෛතික රාමුව තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම | • ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක පුරවැසියකුගේ අයිතිවාසිකම් පැහැදිලි කරයි.<br>•පුරවැසියකු වශයෙන් යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම අයිතිවාසිකම් සුරක්ෂිත වීම කෙරෙහි අත්‍යවශ්‍ය බව සාකච්ඡා කරයි.<br>•නෛතික රාමුව තුළ අයිතිවාසිකම් භුක්ති විඳීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වන බව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.3.3<br>ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය අගය කරයි. | • දේශපාලන පක්ෂ<br>• දේශපාලන පක්ෂ හැඳින්වීම<br>• ජන සමාජයක එක්සත් බව ඇති කිරීම සඳහා දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය | • දේශපාලන පක්ෂයක් යන්න කෙටියෙන් හඳුන්වයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක පවතින පක්ෂ ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරයි.<br>• ජන සමාජයක එක්සත් බව ගොඩ නැගීම සඳහා දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය අගය කරමින් අදහස් දක්වයි. | 02 |
| | 9.3.4<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක මැතිවරණ හා ඡන්ද බලය පිළිබඳ ව විමර්ශනය කරයි. | • ඡන්ද බලය හා මැතිවරණ<br>• ඡන්ද බලය සහ මැතිවරණ හැඳින්වීම<br>• ජනතාව පාලනයට සහභාගි වන අවස්ථා<br>• සර්වජන ඡන්ද බලය සහ එහි වැදගත්කම<br>• මැතිවරණ, මැතිවරණ සම්බන්ධ ජනතා අයිතිවාසිකම් හා යුතුකම් | • ඡන්ද බලය යන්න පැහැදිලි කරයි.<br>• මැතිවරණ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• ජනතාව පාලනයට සහභාගි වන අවස්ථා නම් කරයි.<br>• සර්වජන ඡන්ද බලය හා එහි වැදගත්කම පැහැදිලි කරයි.<br>• මැතිවරණයක දී ඡන්ද දායකයකු, ඡන්ද අපේක්ෂකයකු වශයෙන් හිමි වන අයිතිවාසිකම් පිළිබඳ ව සාකච්ඡා කරයි.<br>• මැතිවරණ සම්බන්ධයෙන් තම යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.3.5<br>ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු ලෙස, අවස්ථෝචිත ව ස්ථිරසාර භාවයෙන් කටයුතු කරයි. | • ස්ථිරසාර භාවය හැඳින්වීම<br>• ස්ථිරසාර භාවය ගොඩනගා ගැනීම සඳහා පුද්ගලයකු තුළ ගොඩනගාගත යුතු ගුණාංග<br>උදාහරණ:-<br>- ඍජු බව<br>- මෘදු බව<br>- අවංක බව<br>- ගරු කිරීම<br>- සවන් දීම<br>• තමා සමඟ ස්ථිරසාර භාවය<br>• අනුන් සමඟ ස්ථිරසාර භාවය<br>• තම හැඟීම් අවස්ථෝචිත ව සදාචාරාත්මක ව ප්‍රකාශ කිරීම<br>• ශුභවාදී ආකල්පවලින් යුක්ත ව විචාරශීලී ව ඍජු ප්‍රතිපත්ති මත කටයුතු කිරීම | • ස්ථිරසාර භාවය යන්න පැහැදිලි කරයි.<br>• පුද්ගල ජීවිතයේ දී ස්ථිරසාර භාවයේ ඇති වැදගත්කම විස්තර කරයි.<br>• සමාජ ජීවිතයේ දී ස්ථිරසාර භාවයේ අවශ්‍යතාව සාකච්ඡා කරයි.<br>• පුද්ගලයා තුළ ස්ථිරසාර බව ගොඩනගා ගැනීමට වර්ධනය කර ගත යුතු ගුණාංග පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.3.6<br>ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු ලෙස ජාතිය ගොඩනැගීමේ කාර්යය සඳහා කැප වීමෙන් ක්‍රියා කරයි. | • ජාතිය ගොඩනැගීම යන්න හැඳින්වීම<br>• ජාතිය ගොඩනැගීම සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව<br>• ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට දායක වීම<br>• ජාතික ප්‍රතිපත්තිවලට අනුගත ව කටයුතු කිරීම<br>• ජාතිය ගොඩනැගීම සඳහා තම දායකත්වය කැප වීමෙන් යුතු ව ලබා දීමේ වැදගත්කම<br>• පුරවැසියකු වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග<br>උදාහරණ:-<br>- තමාගෙන් ඉටු විය යුතු යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම<br>- සමාජයෙන් තමාට ලැබිය යුතු දෙයට වඩා තමාගෙන් සමාජයට ලබා දිය යුතු දායකත්වය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම<br>- ශ්‍රී ලාංකිකයන් වශයෙන් ජාතික සමඟිය හා සාමය ගොඩනැගීමට දායක වීම | • ජාතිය ගොඩනැගීමේ සංකල්පය පැහැදිලි කරයි.<br>• ජාතිය ගොඩනැගීම සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව විස්තර කරයි.<br>• පුරවැසියකු වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග යෝජනා කරයි.<br>• ජාතිය ගොඩනැගීම සඳහා කැප වීමෙන් කටයුතු කිරීම සෑම පුරවැසියකුගේ ම යුතුකමක් බව අභිමානයෙන් යුතු ව සාකච්ඡා කරයි.<br>• ශ්‍රී ලාංකිකයෙකු වශයෙන් ජාතික සමඟිය හා සාමය ගොඩනැගීම සඳහා කැප වීමෙන් යුතු ව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| පළාත් පාලන ආයතන<br>9.4<br>පොදු යහපතට හේතු වන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහාය දක්වයි. | 9.4.1<br>පළාත් පාලන ආයතනවල ව්‍යුහය විමර්ශනය කරයි. | • පළාත් පාලනය හැඳින්වීම<br>• පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව<br>• පළාත් පාලනයේ ඓතිහාසික පසුබිම<br>• පළාත් පාලන ආයතනවල ව්‍යුහය | • ''පළාත් පාලනය'' පැහැදිලි කරයි.<br>• පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව විස්තර කරයි.<br>• පළාත් පාලනයේ ඓතිහාසික විකාශනය විමර්ශනය කරයි.<br>• පළාත් පාලන ආයතනවල සංවිධාන ව්‍යුහය පැහැදිලි කරයි.<br>• තම ප්‍රදේශය අයත් වන පළාත් පාලන ආයතනය නම් කරයි. | 02 |
| | 9.4.2<br>තම ප්‍රදේශයට පළාත් පාලන ආයතනවලින් සිදු වන සේවා පිළිබඳ ව විමර්ශනය කරයි. | • පළාත් පාලන ආයතනවලින් ඉටු වන සේවා<br>උදාහරණ:-<br>- සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා<br>- කසළ කළමනාකරණය<br>- පුස්තකාල හා කියවීම් ශාලා පවත්වාගෙන යෑම<br>- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම<br>- පොදු වෙළෙඳපොළ පවත්වාගෙන යෑම | • පළාත් පාලන ආයතන මඟින් ඉටු කරන සේවා විස්තර කරයි.<br>• ජන ජීවිතය යහපත් කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන වලින් ඉටු වන සේවය අගය කරමින් අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.4.3<br>පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන යුතුකම් ඉටු කරයි. | • පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධ මහජන යුතුකම්<br>උදාහරණ:-<br>- බදු මුදල් කලට වේලාවට ගෙවීම (වරිපණම්)<br>- පළාත් පාලන ආයතන කටයුතුවලට සහාය වීම | • පළාත් පාලන ආයතනවලින් සපයන සේවා සම්බන්ධයෙන් තම යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.<br>• සේවාලාභීන්ගේ යුතුකම් මැනවින් ඉටු කිරීම එම සේවා කාර්යක්ෂම ව පවත්වාගෙන යෑමට හේතු වන බවට අදහස් දක්වයි. | 01 |
| | 9.4.4<br>පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමේ අවශ්‍යතාව විමර්ශනය කරයි. | • පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීම සඳහා ඉටු විය යුතු යුතුකම් හා වගකීම්<br>• මහජන නියෝජිතයන්ගෙන්<br>• නිලධාරීන්ගෙන් | • පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීම සඳහා මහජන නියෝජිතයන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.<br>• පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව පවත්වාගෙන යෑම සඳහා නිලධාරීන්ගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් විස්තර කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.4.5<br>පළාත් පාලන ආයතන මඟින් ජාතික සංවර්ධනයට ලබා දෙන දායකත්වය විමර්ශනය කරයි. | • ප්‍රාදේශීය අවශ්‍යතා හඳුනා ගැනීම<br>• ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම<br>• සැලසුම් නිසි පරිදි ක්‍රියාවට නැඟීම<br>• ප්‍රාදේශීය නායකයන් බිහි කිරීම | • පළාත් පාලන ආයතනවලින් ප්‍රාදේශීය සංවර්ධනයට දෙන දායකත්වය පැහැදිලි කරයි.<br>• ප්‍රාදේශීය සංවර්ධනයෙන් ජාතික සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ වැදගත්කම සාකච්ඡා කරයි. | 02 |
| ගැටුම් නිරාකරණය<br>9.5<br>ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය නිපුණතා ප්‍රදර්ශනය කරයි. | 9.5.1<br>ගැටුම් පිළිබඳ ව විශ්ලේෂණය කරයි. | • ගැටුම් නිර්වචනය කිරීම<br>  • ගැටුම්වලට හේතු<br>  • ගැටුම් ඇති වන පාර්ශ්ව<br>  • විවිධ ගැටුම් වර්ග | • ගැටුම් නිර්වචනය කරයි.<br>• ගැටුම්වලට හේතු පැහැදිලි කරයි.<br>• ගැටුම් ඇති වන පාර්ශ්ව පිළිබඳ සාකච්ඡා කරයි.<br>• ගැටුම් වර්ග විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.5.2<br>ගැටුම් නිරාකරණයට යෝග්‍ය ක්‍රමවේද අනුගමනය කරයි. | • ගැටුම් නිරාකරණයෙහි ලා මතු විය හැකි බාධක<br>උදාහරණ:-<br>- දෘඩි ස්ථාවර බව<br>- එක ම විසඳුමක රැඳී සිටීම<br>- අනෙක් පාර්ශ්වය පරදවා තමා ජය ගැනීමට සිතීම<br>• ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග<br>• ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද | • ගැටුම් නිරාකරණය කිරීමේ දී ඇති වන බාධක පැහැදිලි කරයි.<br>• ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග සාකච්ඡා කරයි.<br>• ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද විස්තර කරයි. | 02 |
| | 9.5.3<br>ගැටුම් සුහවාදී ව නිරාකරණය කරයි. | • ගැටුම් සුහවාදී ව නිරාකරණය කිරීමේ වාසි<br>• සාමය ස්ථාපිත වීම<br>• සම්පත් නාස්තිය අවම වීම<br>• විශ්වාසය ගොඩනැඟීම<br>• ගැටුම් සුහවාදී ව නිරාකරණය නොකර ගැනීමේ ප්‍රතිවිපාක | • ගැටුම් සුහවාදී ව නිරාකරණය කිරීමේ වාසි සාකච්ඡා කරයි.<br>• ගැටුම් සුහවාදී ව නිරාකරණය නොකර ගැනීමේ ප්‍රතිවිපාක විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| වැඩ ලෝකය<br>9.6<br>වැඩ ලෝකයට සූදානම් වෙයි. | 9.6.1<br>මනා ව සැලසුම් කරන ලද පෞද්ගලික ගොනුවක් පවත්වාගෙන යෑමේ වැදගත්කම අගය කරයි. | • පෞද්ගලික ගොනුවක ඇතුළත් විය යුතු වැදගත් තොරතුරු<br>• පෞද්ගලික තොරතුරු<br>• පෞද්ගලික ගුණාංග<br>• පෞද්ගලික කුශලතා<br>• පෞද්ගලික චර්යා<br>• පාසල තුළ දී සහ ඉන් පිටත දී ලබා ගන්නා අත්දැකීම් | • තම පෞද්ගලික ගුණාංග, කුශලතා හා චර්යා විස්තර කරයි.<br>• තම හැඟීම්, මත හා අදහස් අන් අය සමඟ හුවමාරු කර ගනියි.<br>• අන් අයගේ මත ගරු කරයි.<br>• විස්තර සහිත පෞද්ගලික ගොනුවක් සකස් කර ගනියි.<br>• පෞද්ගලික ගොනුවක් පවත්වා ගැනීමෙන් තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගත හැකි බව පවසයි. | 01 |
| | 9.6.2<br>විවිධ වෘත්ති/ රැකියා විශ්ලේෂණය කරයි. | • විවිධ වෘත්ති/රැකියා ක්ෂේත්‍ර<br>• පෞද්ගලික සහ රාජ්‍ය/ ස්වේච්ඡා/ සමාජ සුභසාධන සේවා<br>• සේවා දායක හෝ සේවා යෝජක / ස්වයං රැකියාවල නියුතු<br>• ගෘහස්ථ හෝ එළිමහන්/ ස්ථිර ස්ථාන හෝ ජංගම ස්ථාන<br>• මූල්‍යමය අපේක්ෂාව හෝ සතුට<br>• සෑම වෘත්තියක ම / රැකියාවක ම/ සමාජීය වටිනාකමක් හා ගෞරවාන්විත භාවයක් තිබීම | • තමා අපේක්ෂා කරන රැකියාව / වෘත්තිය පිළිබඳ ව විමසා බලයි.<br>• විවිධ රැකියා සඳහා පවතින විශේෂිත ඉල්ලුම් පිළිබඳ ව පරීක්ෂා කරයි.<br>• රැකියාවේ තෘප්තිමත් භාවය, ඉන් ලබා ගන්නා මූල්‍යමය ප්‍රතිලාභ මෙන් ම වැදගත් බව සාකච්ඡා කරයි.<br>• සෑම රැකියාවක් ම වටිනා බව ප්‍රකාශ කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.6.3<br>විවිධ රැකියා/ වෘත්ති සඳහා පිවිසුම් ගවේෂණය කරයි. | • විවිධ රැකියා/වෘත්තීන් සඳහා පිවිසුම්<br>• පාසලේ විෂය/ විෂය ධාරා තෝරා ගැනීම<br>• ශාස්ත්‍රීය/ වෘත්තීය සුදුසුකම්<br>• විධිමත් හා ස්වේාස්ථ රැකියා පුහුණු වීම් | • ළඟා කර ගත හැකි පෞද්ගලික ඉලක්ක ඇති කර ගැනීමේ වටිනාකම පැහැදිලි කරයි.<br>• වඩාත් ම උචිත වූ විෂය/ විෂය ධාරාව/පාඨමාලාව තෝරා ගනියි.<br>• සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා ශාස්ත්‍රීය/ වෘත්තීය පුහුණු අධ්‍යයන කවරේ දැයි විමසා බලයි.<br>• වෘත්තීය ඉලක්කයක් කරා ළඟා වීමට විවිධ මාර්ග තිබෙන බව පැහැදිලි කරයි. | 01 |
| | 9.6.4<br>රැකියා/ වෘත්ති සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ව විමර්ශනය කරයි. | • වෘත්තීය පිවිසුම් සඳහා විෂයයන් / විෂය ධාරාව නිවැරදි ව තෝරා ගැනීමේ වැදගත්කම<br>• විශේෂිත රැකියා/ වෘත්ති සඳහා ශාස්ත්‍රීය, කාලානුරූප, මානසික හා කායික ඉල්ලුම.<br>• උසස් හා වැඩිදුර අධ්‍යාපන පාඨමාලා / ආධුනිකත්ව පුහුණු<br>• විවිධ වෘත්ති සඳහා අදාළ විෂය දැනුම හා පළපුරුද්ද පවුලේ සාමාජිකයින්ගේ වෘත්ති ඇසුරෙන් ලබා ගැනීම | • තමා වඩා කැමති වෘත්තීය සඳහා නිවැරදි විෂයයක්/ විෂය ධාරාවක් තෝරා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.<br>• තෝරා ගන්නා ලද විශේෂිත රැකියාව සඳහා කෙටි කාලීන ව හා දිගුකාලීන ව සපුරාගත යුතු ශාස්ත්‍රීය හා වෙනත් අවශ්‍යතා පිළිබඳ ව විමසා බලයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | උදාහරණ:-<br>- පවුලේ සාමාජිකයන් සමඟ ධීවර කටයුතුවල හා ගොවිතැන් කටයුතුවල යෙදීම<br>- ආහාර පාන වෙළෙඳාම වැනි කටයුතු | • තෝරා ගන්නා ලද රැකියාවක් සඳහා ශාස්ත්‍රීය සුදුසුකම්වලට අමතර ව ප්‍රායෝගික දැනුම හා පළපුරුද්ද ඉවහල් වන බව පැහැදිලි කරයි. | |
| | 9.6.5<br>ඉතා උසස් ලෙස සැකසූ ජීව දත්ත පත්‍රිකාවක් තබා ගැනීමේ වැදගත්කම අගය කරයි. | • ජීව දත්ත පත්‍රිකාවකට ඇතුළත් කළ යුතු වැදගත් කරුණු<br>උදාහරණ:-<br>- පෞද්ගලික තොරතුරු<br>- අධ්‍යාපන සුදුසුකම්<br>- අදාළ පළපුරුද්ද<br>- පෙර රැකියා තොරතුරු<br>- කුසලතා, ගුණාංග<br>- ලබාගත් ජයග්‍රහණ<br>- තොරතුරු ලබාගත හැකි පුද්ගලයෝ<br>• වෙනත් ජීව දත්ත පත්‍රිකා අතුරෙන් තමාගේ ජීව දත්ත පත්‍රිකාවේ ඇති සුවිශේෂී බව | • වඩාත් පැහැදිලි හා ක්‍රමවත් ජීව දත්ත පත්‍රිකාවක ඇතුළත් විය යුතු කරුණු ගැන පරීක්ෂා කරයි.<br>• සේවා යෝජකයාගේ අවධානය දිනා ගත හැකි ජීව දත්ත පත්‍රිකාවක් සකස් කර ගැනීමට දැනුම්වත් වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.6.6<br>රැකියා ඉල්ලුම් පත්‍රයක් නිවැරදි ව සම්පූර්ණ කර ගන්නා ආකාරය අවබෝධ කර ගනියි. | • පළමු ව ඉල්ලුම් පත්‍රයේ කටු පිටපතක් සම්පූර්ණ කර ගැනීමේ වැදගත්කම<br>• රැකියා විස්තරය අනුව නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම<br>• අන් අයගේ අයදුම්පත් අතුරින් තම අයදුම්පත හඳුනා ගැනීමට අවශ්‍ය මූලික පෞද්ගලික තොරතුරු සැපයීම<br>උදාහරණ:-<br>- රැකියාවට අදාළ පෞද්ගලික ළැදියා හා විනෝදාංශ<br>• සපයන ලද ඉඩකඩ ඥානාන්විත ව පාවිච්චි කිරීම, ජීව දත්ත සටහන අමුණා තැබීම<br>• අවසාන දිනට පෙර ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම | • රැකියා ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට යොදා ගන්නා කාලය ඵලදායක බව අවබෝධ කර ගනියි.<br>• ඵලදායි රැකියා ඉල්ලුම් පත්‍රයක අඩංගු විය යුතු කරුණු පැහැදිලි ව විස්තර කරයි.<br>• අයදුම්පතෙහි තොරතුරු ඉදිරිපත් කරන ආකාරය සහ සැකැස්ම සේවා යෝජකයා/ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත හිතකර බලපෑමක් ඇති කරන බව පැහැදිලි කරයි.<br>• ඉල්ලුම් පත්‍රයක් අවසන් දිනට පෙර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව විස්තර කරයි. | 01 |
| | 9.6.7<br>රැකියා ඇබෑර්තුවක් සඳහා ලිපියක් ලිවීමේ දී ඇතුළත් විය යුතු පියවර ගැන විශ්ලේෂණය කරයි. | • ඉල්ලුම් කිරීම සඳහා ලියන ලිපියේ කටු සටහනක් සැකසීමේ වැදගත් කම<br>• අන්තර්ගතය තර්කානුකූල ව පෙළ ගැස්වීම<br>• අවශ්‍ය වන වැදගත් තොරතුරු, අධ්‍යාපන සුදුසුකම්, (අදාළ පළපුරුද්ද, ළැදියා හා විනෝදාංශ) | • ලිපියේ කටු සටහන සකස් කිරීමට වැය කළ කාලය ප්‍රයෝජනවත් බව විස්තර කරයි.<br>• ඵලදායක ලිපියක අඩංගු විය යුතු කරුණු පිළිබඳ ව පැහැදිලි කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.6.8<br>සම්මුඛ පරීක්ෂණ කුශලතාවල වැදගත්කම අභ්‍යන්තරීකරණය කර ගනියි. | • දැන්වීමේ පළ කරන සියලු කරුණු සඳහා තොරතුරු සැපයීම<br>• අනික් ලිපි අතුරෙන් තම ලිපිය කැපී පෙනෙන සේ ඉතා වැදගත් තොරතුරු ඉදිරිපත් කිරීම<br>• ඇබෑර්තු සඳහා අවසාන දිනට පෙර ප්‍රතිචාර දැක්වීම<br>• සම්මුඛ පරීක්ෂණ කුසලතා වර්ධනය කර ගැනීම<br>උදාහරණ:-<br>- ප්‍රශ්නය අසා නිම වන තුරු අසා සිට ප්‍රශ්නයට උත්තර සැපයීම<br>• ප්‍රශ්නය හොඳින් ශ්‍රවණය කර සිතා බලා අවංක ව උත්තර සැපයීම<br>• පැහැදිලි ව බස හැසිරවීම<br>• සම්මුඛ පරීක්ෂකවරුන්ගෙන් ප්‍රශ්න ඇසීමට සූදානම් වීම<br>• ව්‍යාකුල අවස්ථාවන්හි දී තැන්පත් ව සිටීම.<br>• ප්‍රතිපෝෂණ ලබා ගැනීම හා ඒ අනුව කටයුතු කිරීම | • දැන්වීමේ සඳහන් සෑම ප්‍රශ්නයකට ම උත්තර සැපයිය යුතු බව පැහැදිලි කරයි.<br>• තොරතුරු ඉදිරිපත් කරන ආකාරය සේවා යෝජකයා තුළ යහපත් බලපෑමක් ඇති කරන බව විස්තර කරයි.<br>• අවසාන දිනයට පෙර ලිපිය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• සම්මුඛ පරීක්ෂණ කුශලතා වර්ධනය කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ඍජු උත්තර සැපයීම සඳහා හොඳින් ශ්‍රවණය කළ යුතු බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රතිචාර කෙටියෙන් හා සුපැහැදිලි ව ඉදිරිපත් කළ යුතු බව පැහැදිලි කරයි.<br>• සම්මුඛ පරීක්ෂණ අවස්ථා සාමාන්‍යයෙන් මානසික ආතතිය ඇති කර වන්නක් විය හැකි බව තේරුම් ගෙන අසන | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • ආදර්ශ සම්මුඛ පරීක්ෂණය සඳහා හොඳින් සූදානම් වීම<br>• සම්මුඛ පරීක්ෂණ අවස්ථාවල දී ආතතිය ඇති විය හැකි බව | ප්‍රශ්නවලට සාවධාන ව උත්තර දීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අවස්ථාවක් ලැබුණහොත් ප්‍රශ්න ඇසීමට සූදානමක් තිබිය යුතු බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රතිපෝෂණ ලබා ගැනීමට ඇති අවශ්‍යතාව හා ඒ අනුව ක්‍රියා කිරීමේ වාසි පැහැදිලි කරයි.<br>• සාර්ථකත්වය මනා සූදානම මත රඳා පවතින බව පැහැදිලි කරයි.<br>• අයදුම් කරන ලද රැකියාවේ ස්වභාවය අනුව අසනු ලැබිය හැකි යැයි අනුමාන කරන ලද ප්‍රශ්න පිළිබඳ ව සාකච්ඡා කරයි. | |
| | 9.6.9<br>සම්මුඛ පරීක්ෂණයකට හොඳින් මුහුණ දීමේ වැදගත්කම අගය කරයි. | • සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීම<br>★ පෞද්ගලික පෙනුම (හිසකෙස් සකස් කිරීම, අංග රචනය (Make up) , ඇඳුම් පැළඳුම්)<br>★ ශරීර භාෂාව (Body Language) ඉඳ ගැනීම, ඇස් හැසිරවීම (Eye Contact) මුහුණෙන් පෙන්වන හැඟීම්, අත් චලන (Use of hands) | • සම්මුඛ පරීක්ෂණයක දී තම පෞද්ගලික පෙනුම සේවා යෝජකයාට වැදගත් වන බව ප්‍රකාශ කරයි.<br>• පළමු ව ඇති කර ගන්නා ප්‍රතිරූපය දීර්ඝ කාලීන ව වැදගත් වන බව සාකච්ඡා කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | | • අවධානය හා උනන්දුව<br>• කථනය හා බස හැසිරවීම<br>• ආචාර සම්පන්න වීම | • ශරීර භාෂාව (Body Language) අවධානය ලබා ගැනීමට වැදගත් වන බව ප්‍රකාශ කරයි.<br>• ආචාර සම්පන්න බව සම්මුඛ පරීක්ෂණවල දී නිරීක්ෂණය කරන බව පැහැදිලි කරයි. | |
| | 9.6.10<br>කාලය මනා සේ කළමනාකරණය කර ගැනීමේ වැදගත්කම අගය කරයි. | • සේවාදායකයකු ලෙස කාලය මනා සේ කළමනාකරණය කර ගැනීමේ වැදගත්කම<br>• කළ යුතු කාර්ය ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්වීම<br>• පෞද්ගලික කාලය/ වැඩ කිරීමට ඇති කාලය/ අධ්‍යයන කටයුතු සඳහා ඇති කාලය<br>• ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ගැන සේවායෝජකයාගේ අවධානය | • රැකියා ස්ථානයේ දී කාලය කාර්යක්ෂම ව යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• කළ යුතු කාර්ය ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්වීමේ අවශ්‍යතාව සාකච්ඡා කරයි.<br>• පෞද්ගලික අවශ්‍යතා, පුහුණුව හා කාර්ය සාධනය සඳහා කාලය තුලනය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• සේවාදායකයන්ට ලබා දෙන මූල්‍ය ප්‍රතිලාභවලට සරිලන පරිදි සේවයක් ලබා ගැනීමට සේවායෝජකයාට අයිතියක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• සේවාදායකයා ගැන සේවායෝජකයා දරන මතය | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | ආයතනයේ දියුණුවට බලපාන ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි. | |
| | 9.6.11<br>සැමවිට ම හොඳින් හැසිරීමේ වැදගත්කම අගය කරයි. | • පෞද්ගලික හැසිරීම<br>• තම හැසිරීම යහපත් හෝ අයහපත් හෝ ආකාරයට අන් අයට බලපෑම් ඇති කිරීම හා අන් අයගේ බලපෑම්<br>• දුර්වල හැසිරීම් වාර්තා නිසා වෘත්තීය සංවර්ධනයට ඇති වන බලපෑම<br>• නියමිත වේලාවට පැමිණීම හා වැඩ කිරීම<br>• නිෂ්පාදන ඌනතා/ මානව සම්පත් ඌනතා අවස්ථාවල දී ස්වකැමැත්තෙන් උදවු කිරීම | • රැකියා ස්ථානයේ දී සැම කාර්යයක් සඳහා ම ඉතා අවධානයෙන් කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>• සමහර රැකියාවල නිරත වීම රැකියා කාලයෙන් පසු වත් (Working hours) අහිතකර බලපෑම් ඇති කිරීමට හේතු වන බව පැහැදිලි කරයි.<br>• සේවා ආයතනයේ සියලු දෙනාට ම එක ලෙස ගරු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• තම ක්‍රියා කලාපය අන් අයට අහිතකර සේ බලපෑම් ඇති කළ හැකි බව හා එසේ ම අන් අයගේ ක්‍රියා කලාපය තමාට බලපෑම් ඇති කළ හැකි බව සාකච්ඡා කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • නියමිත වෙලාවට වැඩ නොකිරීම, පැමිණීමේ දුර්වලතා හා දුර්වල ක්‍රියාකාරිත්වය තමාගේ වෘත්තීය සංවර්ධනයට බාධා ඇති කරන බව විස්තර කරයි.<br>• රැකියා ස්ථානයේ යම් පීඩාකාරී අවස්ථාවල දී සේවය ලබා දීම යහපත් සාමූහික ක්‍රියාවක් වන අතර එය කැමැත්තෙන් හා දැනුම්වත් භාවයෙන් කළ යුතු බව ප්‍රකාශ කරයි. | |
| | 9.6.12<br>නිවැරදි පෞද්ගලික මූල්‍ය කළමනාකරණය පිළිබඳ ගවේෂණය කරයි. | • ආදායම හා වියදම<br>• සැලකිලිමත් ලෙස මුදල්/වැටුප පරිහරණය<br>• සාමාන්‍ය හෝ හදිසි හෝ අවස්ථාවල දී මුදල් යෙදවීම<br>• බැංකු ගිණුමක් විවෘත කිරීම/පවත්වා ගෙනයෑම<br>• අනාගතය සඳහා ඉතිරි කිරීම<br>• පරිභෝජනය සඳහා ණය ගනුදෙනුවලින් වැළකී සිටීම<br>• (Credit Card) ණයපත්වල වාසි/අවාසි<br>• අනාගතය සඳහා ආයෝජනය කිරීම හෝ ඉතිරි කිරීම | • පෞද්ගලික මුදල් කළමනාකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• අය වැය තමාගේ ආදායමට අනුව සකස් කර ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ක්‍රමවත් ඉතුරුම් සඳහා ලැබෙන වාසි පැහැදිලි කරයි.<br>• ණය වීමේ හා ණයපත් (Credit Card) භාවිතයේ අවදානම විස්තර කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | | • වයස්ගත කාලය සඳහා විශ්‍රාම වැටුප් / අර්ථ සාධක අරමුදල් | • සේවයේ යෙදී සිටිය දී අනාගත සුරක්ෂිතතාව වෙනුවෙන් මුදල් ඉතිරි කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• විශ්‍රාම වැටුප පරිහරණය හා එවැනි වැටුපක් නොමැති අවස්ථාවල දී මුදල් පරිහරණය කළ යුතු ආකාරය විස්තර කරයි. | |
| | 9.6.13<br>වෘත්තීය හා පෞද්ගලික ජීවිතය සමතුලිත ලෙස පවත්වාගෙන යෑමේ වැදගත්කම අගය කරයි. | • කාර්යවල හොඳ සම්මිශ්‍රණයක් පවත්වා ගැනීමේ වැදගත්කම<br>• අනාගතය සඳහා වැඩ පුහුණුව, ක්‍රීඩා, විවේකය, පවුලේ සාමාජිකයන් සමඟ හා පෞද්ගලික ව විවේකය ගත කිරීමේ වැදගත්කම<br>• මූල්‍ය අපහසුතා ඇති අවස්ථාවල දී උපදෙස් ලබාගත හැකි පාර්ශ්ව (උදාහරණ:- දෙමාපියෝ) | • වෘත්තීය ජීවිතය හා සමාජීය ජීවිතය සමතුලිත ව පවත්වාගෙන යෑමේ වැදගත්කම විස්තර කරයි.<br>• මූල්‍ය අපහසුතා ඇති වූ අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරයි. | 01 |

## 4.0 ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රමෝපාය

පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී විෂයයෙන් අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීමට යෝග්‍ය ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම සඳහා ගුරු-දෙමවුපියන් පහසුකම් සලසන්නන් ලෙස ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ. මෙහි දී දේශන ක්‍රමය වැනි සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රම වෙනුවට සජීව සමාජ අත්දැකීම් ලබා දීම මගින් විෂය කරුණු අධ්‍යයනයට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම සඳහා පහසුකම් සලසන්නකු ලෙස විවිධ සම්පත් උපයෝගී කර ගනිමින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීම සඳහා යෝග්‍ය ඉගෙනුම් අවස්ථා සැලසුම් කිරීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් සැම විට ම උනන්දු විය යුතු ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයට අදාළ දැනුම සෙවීම සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කිරීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මගින් යහපත් පුරවැසි ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම ගුරු කාර්යභාරයේ මූලික වගකීම හා යුතුකම වේ. මෙහි දී යහපත් පුරවැසියන් රටට දායාද කිරීමේ වගකීමෙන් බැඳුණු ආචාර ධර්ම පද්ධතියක් මත පිහිටා කටයුතු කිරීම ද ඉතා වැදගත් වේ.

විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශය හොඳින් අධ්‍යයනය කර ජාතික අරමුණු, විෂය අරමුණු, විෂය නිපුණතා හා විෂය අන්තර්ගතය අතර පවතින සබැඳියාව මැනවින් තේරුම් ගෙන වඩාත් යෝග්‍ය ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිතයට යොමු විය යුතු ය.

එකිනෙකා අභිභවා කරගකාරීව, විභාග මානසිකත්වයෙන් හා ආත්මාර්ථකාමී ව ඉගෙනුමෙහි යෙදෙනවා වෙනුවට සාමූහිකව සහජීවනයෙන් හා සහෝදරත්වයෙන් අධ්‍යාපන කටයුතුවල යෙදීමට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් යොමු කළ යුතු ය. සහයෝගය හා සහජීවනය පදනම් කර ගත් සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට ද එය හේතු වනු ඇත.

මේ අනුව පුරවැසි අධ්‍යාපනය විෂයය ඉගැන්වීම සඳහා භාවිත කළ හැකි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය කිහිපයක් උදාහරණ ලෙස පහත දක්වා ඇත.

- ගවේෂණ
- ප්‍රදර්ශන
- ක්ෂේත්‍ර චාරිකා
- භූමිකා රංගන
- බුද්ධි මණ්ඩල සාකච්ඡා
- විවාද
- ප්‍රශ්නෝත්තර ක්‍රම
- කාර්ය සාධන ගොනු
- බිත්ති පුවත් පත්
- ඉදිරිපත් කිරීම්
- කණ්ඩායම්/ කේවල ක්‍රියාකාරකම්
- සුභසාධක සමිති/ සමාජ සුභසාධන කටයුතු ආදියට දායක වීම
- ශ්‍රමදාන (උදාහරණ:- ආපදා කළමනාකරණ කටයුතු)
- ශිෂ්‍ය පාර්ලිමේන්තුව

විෂය නිර්දේශයට අදාළ නිපුණතා, නිපුණතා මට්ටම් සාධනයට ගැළපෙන පරිදි ඉහත දැක්වෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම නිර්මාණශීලී ව යොදා ගැනීම ඉගෙනුම් ඉගැන්වීම්-ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් හේතු වනු ඇත.

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

ජාතික අවශ්‍යතාවලට ගැළපෙන යහපත් පුරවැසියන් සමාජයට දායාද කිරීම පාසල් සමාජයේ මූලික කාර්යභාරය වේ. පාසල් විෂයමාලාව එම අරමුණු පෙරදැරි කරගෙන සකස් කර ඇත. එමෙන් ම පාසල තුළ ක්‍රියාත්මක කරන සියලු ක්‍රියාකාරකම් එම අරමුණු ඉටු කර ගැනීමට දායක වේ. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා පුරවැසි අධ්‍යාපනය විෂය මඟින් ඉටු කරනු ලබන්නේ මහගු කාර්යභාරයකි.

පවුල් ඒකකයේ සාමාජිකයකු ලෙසත්, පාසලේ සාමාජිකයකු ලෙසත්, ජන සමාජයේ සාමාජිකයකු ලෙසත්, ගෝලීය පුරවැසියකු ලෙසත්, ජීවත් වීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම අරමුණු කරගෙන 6 - 11 පුරවැසි අධ්‍යාපනය විෂයමාලාව සකස්කර ඇත.

පුරවැසි අධ්‍යාපනය විෂයෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත නිපුණතා හා අරමුණු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා නිසි පරිදි මඟ පෙන්වීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇගයීමට ලක් කිරීම සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව පුරවැසි අධ්‍යාපනය විෂය පාසල් විෂයමාලාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති හා වැඩසටහන් යෝජනා කෙරේ.

- ක්ෂේත්‍ර වැඩසටහන් හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම
- කුඩා පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම
- දැනුම මිනුම වැඩසටහන් හා විවාද පැවැත්වීම
- බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන පළ කිරීම
- සම්පත් පුද්ගලයන්ගේ දායකත්වයෙන් වැඩමුළු පැවැත්වීම
- මානව අයිතිවාසිකම් භුක්ති විඳීම ඒ හා බැඳුණු හා යුතුකම් ඉටු කිරීම මඟින් මානව ගරුත්වය පිළිබඳ ව යහපත් ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම
- වැඩ ලෝකය තුළ ඵලදායි ශ්‍රමිකයකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- ආපදා කළමනාකරණය හා සම්බන්ධ දැනුම හා කුසලතා, පෙර සූදානම් අභ්‍යාස (Mock drill) මඟින් යාවත්කාලීන කිරීම
- විනයගරුක හා නීතිගරුක පුරවැසියන් බිහි කිරීමට යෝග්‍ය වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම
- පරිසර සංරක්ෂණයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පුද්ගල සංවර්ධනය හා නායකත්ව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
- ශිෂ්‍ය පාර්ලිමේන්තුව පාසල තුළ ක්‍රියාත්මක කිරීම
- ශිෂ්‍ය-ශිෂ්‍යාවන් එදිනෙදා මුහුණ පාන ගැටලු ඵලදායි ලෙස විසඳා ගැනීමේ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතික හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම

- විෂය සමගාමී වැඩ සටහන් පාසල් ලිතට ඇතුළත් කිරීම හා ඒවා ඵලදායි ව ක්‍රියාවට නැංවීම. (උදාහරණ:- ලෝක ළමා දිනය, ලෝක ගුරු දිනය, වැඩිහිටි දිනය, විවිධ සංස්කෘති නියෝජනය වන උත්සව)

- ප්‍රදේශයේ පවතින අනෙකුත් රාජ්‍ය, පෞද්ගලික හා ස්වේච්ඡා සංවිධාන සමග අවශ්‍ය අවස්ථාවල දී එක් ව කටයුතු කිරීමට අවස්ථා සලසා ගැනීම

  විෂය භාර ගුරුභවතුන්ගේ සහභාගිත්වය ඇති ව මෙම කාර්යයන් සැලසුම් කිරීම හා ඵලදායි ව ක්‍රියාත්මක කිරීම මඟින් විෂය අරමුණු ඉටු කර ගැනීමටත්, ශිෂ්‍ය නිපුණතා සංවර්ධනය කිරීමටත් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

## 6.0 තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කර ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

- එක් එක් පාසල් වාරය අවසානයේ දී පාසල් මට්ටමින්, කලාප මට්ටමින් හෝ පළාත් මට්ටමින් හෝ වාර පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

## විෂය නිර්දේශය සම්පාදක මණ්ඩලය

**අභ්‍යන්තර**

| | | |
|---|---|---|
| ඒ. එල්. එස්. අබේවික්‍රම මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| එස් යු අයි කේ ද සිල්වා මිය | කථිකාචාර්ය | සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |

**බාහිර**

| | | |
|---|---|---|
| සී.එස් ජයසිංහ මයා | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික), | හොරණ |
| පී.ඩී. සෝමාවතී මිය | ගුරු උපදේශිකා (විශ්‍රාමික) | බුලත්සිංහල |
| සී.එස්.කේ. කුමරප්පෙරුම | ගුරු උපදේශිකා (විශ්‍රාමික) | ශ්‍රී ජයවර්ධනපුර |
| ඩී.එන්. ජයාංගනී මිය | නියෝජ්‍ය විදුහල්පති | මහරගම ම.ම.වි., මහරගම |
| ආචාර්ය ශාමින්ද වනසිංහ මයා | කථිකාචාර්ය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| එම්.කේ. කිංස්ලි ප්‍රියන්ත මයා | කථිකාචාර්ය | රුහුණ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දූව, ගාල්ල |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර මයා | ගුරු සේවය | පොලේගොඩ ම.වි, මහගම |
| එම්.එච්.එම්. යාකුත් මයා | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික) | ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |